**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**
**අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 212 | විභාග දෙපාර්තමේන්තුව |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.39,643,980,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.38,336,126,326 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 5,350,039 ත් රු.1,158,676,619 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 ත් සියයට 7ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 126 | 37,358,905,000 | 36,200,228,381 | 1,158,676,619 | 3 |
| 212 | 2,206,750,000 | 2,062,922,984 | 143,827,016 | 6 |
| 213 | 78,325,000 | 72,974,961 | 5,350,039 | 7 |
| එකතුව | 39,643,980,000 | 38,336,126,326 | 1,307,853,674 | |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එකතුව රු.16,000,000 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලැබී තිබුණු දෙපාර්තමේන්තුව | 2013 දෙසැම්බර් 31 දිනට ලද ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ලද ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| විභාග දෙපාර්තමේන්තුව | 10,000,000 | 2,904,272 | 7,095,728 | 71 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 6,000,000 | 2,313,362 | 3,686,638 | 61 |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය යටතේ ඇති විභාග දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 165 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 156 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 95 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු. | රු. | රු. | |
| 20.03.02.13 | 165,000,000 | 156,306,619 | 8,693,381 | 5 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකකට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12601 | 850,000,000 | 656,880,103 | 675,000,000 | 695,415,936 | 2,750,000,000 | 1,421,746,329 |
| 21201 | 19,000,000 | 16,374,978 | 14,000,000 | 17,071,090 | 100,000,000 | 69,703,732 |
| 21301 | 7,000,000 | 5,831,705 | 3,200,000 | 6,592,383 | 33,000,000 | 18,663,842 |

### 2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවකට අදාළ වාණිජ අත්තිකාරම් ගිණුමක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 21302 | 2,500,000,000 | 2,369,186,533 | 2,350,000,000 | 2,399,981,154 | 4,000,000,000 | 967,840,660 | 1,950,000,000 | 1,884,542,544 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමෙහි මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල 2013 | | 2012 | |
| --- | --- | --- | --- | --- | --- |
| | | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | | රු. | රු. | රු. | රු. |
| 21302 | පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය | 433,094,651 | 1,394,771,435 | 801,531,896 | 903,764,801 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.5,371,579 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- | --- |
| | | රු. |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 7002/0000/00/0254/0013/000 | 5,371,579 |

### 2.4.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 685,519,229 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- | --- |
| | | රු. |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 6000-0000-00-0006-0064-000 | 493,328 |
| | 6000-0000-00-0006-0065-000 | 10,290,430 |
| | 6000-0000-00-0015-0039-000 | 570,539,493 |
| | 6000-0000-00-0015-0177-000 | 142,594 |
| විභාග දෙපාර්තමේන්තුව | 6000-0000-00-0006-0066-000 | 19,604,461 |
| | 6000-0000-00-0015-0094-000 | 76,064,370 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 6000-0000-00-0015-0095-000 | 8,384,553 |
| | | 685,519,229 |

## 2 කොටස

------------

## එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

-----------------------------------------------------

## 1. ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය

---------------------------------------

### 1.1 විගණන විෂය පථය

----------------------

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූලි 25 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149 , 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

---------------------------

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.14 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) විගණන සාක්ෂි නොවීම

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික පාසැල් තුනක එකතුව රු.22,341,273 ක් වූ ගනුදෙනු වර්ග 03 කට අදාළව පිළිවෙලින් ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පැමිණීමේ ලේඛන හා පුහුණු වන සිසුන් සංඛ්‍යාව, විධිමත් ලිපිගොනු සහ වැය ලෙජර හා ආදායම් ලෙජර ආදීවූ සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ජාතික පාසැල් තුනකට අදාළ එකතුව රු.26,770,534 ක ස්ථාවර තැන්පතු සහතික 30 ක් සම්බන්ධයෙන් විධිමත් පරිදි ස්ථාවර තැන්පතු ලේඛන පවත්වා නොතිබුණි.

**(ආ)** විගණන විමසුම්වලට පිළිතුරුදීම

**----------------------------------**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 07 කට 2014 අගෝස්තු 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.385,147,708 ක් විය.

(ඇ) අයවැය විචලනය

---------------------

මූලධන වැය විෂයයන් 13 කට සළසා තිබුණු එකතුව රු.345,671,436 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී තිබුණු අතර, නියමිත කාලවකවානු තුළ සැලසුම් පිළියෙල කර නොතිබීම, ප්‍රමාදවී ප්‍රතිපාදන නිදහස්කර තිබීම, අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගෙන නොතිබීම, ප්‍රමාදවී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර තිබීම, ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය පූර්ව ක්‍රියාමාර්ග ගෙන නොතිබියදී ප්‍රතිපාදන ඉල්ලීම්කර තිබීම හා සුදුසු ස්ථාන හඳුනාගැනීමට කටයුතු කර නොතිබීම, අපේක්ෂිත විදේශාධාර ලැබී නොතිබීම හා නිශ්චිත ව්‍යාපෘති හඳුනාගැනීමකින් තොරව ප්‍රතිපාදන ඉල්ලා තිබීම සහ අග්‍රිම අයදුම් කිරීම වර්ෂය අවසාන දින කිහිපය තුළ සිදුකර තිබීම යනාදී හේතු ඊට බලපා තිබුණි.

(ඈ) අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

----------------------------------------------------

වැය විෂයයන් 25 කට එකතුව රු.12,541,375,496 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.12,290,693,615 ක් උපයෝජනය කළ පසු ඉතිරිය රු.250,681,881 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 94(1) හි දැක්වෙන විධිවිධානවලට පටහැනිව, එම ඉතිරිය ඉක්මවා රු. 6,715,906,570 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම්

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විවිධ තැන්පත් ගිණුමට අදාළ වර්ෂ 2 ක් ඉක්මවූ රු.8,178,649 ක්වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අනියම් සේවකයින්ගේ වැටුපෙන් අවකරණය කර තිබුණු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකය රු.2,176,888 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------------

විෂය අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට වූ හර ශේෂය තුළ, එකතුව රු.48,376,165 ක ගිණුම්කරණ දෝෂ නිසා උද්ගතවූ ශේෂයක් විය. ඉන් එකතුව රු.47,346,582 ක් වසර 5 කට වැඩි කාලයක සිටද, එකතුව රු.357,879 ක් වසර 1 ත් 5 ත් අතර කාලයක සිටද පැවත එමින් තිබුණු දෝෂ වූ අතර, එම දෝෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදි කිරීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර හඳුනා නොගත් වෙනස රු.1,976,928 ක් විය.

(iii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, වර්ෂ 5කට වඩා වැඩි කාලයක සිට අයවීම් සම්පූර්ණයෙන් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු. 125,058,275 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් හා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඒ අතර වූ දේපල ණය ශේෂ 03 ක වටිනාකම රු.700,158 ක් වූ අතර අමාත්‍යාංශය තුළ තිබිය යුතු ඇප ඔප්පු පිළිබඳව සොයා බලා එම ණය අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(iv) මුළු හිඟහිටි ණය ශේෂය රු.2,878,133 කට අදාළ නිලධාරීන් 70 දෙනෙකුගේ ණය ලිපිගොනු හෝ අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ණය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග හෝ ණය අයකර නොගැනීමට හේතු හෝ අනාවරණය කර ගත නොහැකි විය. ලිපිගොනු හෝ අදාළ තොරතුරු පවත්වාගෙන යාම පිළිබඳ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම ලිපිගොනු හෝ තොරතුරු සොයා ගත නොහැකි බව විගණනය වෙත දන්වා තිබුණි.

1.4 වත්කම් කළමනාකරණය

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශය සතු මෝටර් වාහන 02 ක් හා යතුරු පැදි 01 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබීම.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 18 ක, ගුරු විද්‍යාල 09 ක හා ජාතික පාසැල් 350 ක සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 ජූලි 01 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු ස්ථාවර වත්කම් ලේඛනයට අනුව, අමාත්‍යාංශය සතුව තිබුණු වාහන 06 ක් භෞතික පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන් අපොහොසත් විය. එම වාහන 06 2013 ජනවාරි 31 දින සිට වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් තිබුණු බැවින් වාහනවල අයිතිය එම අමාත්‍යාංශය වෙත පවරා ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට හෝ වාහන ආපසු ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

2013 ජනවාරි 28 දින සිට අළුතින් පිහිට වූ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ වියදම්, අධ්‍යාපන අමාත්‍යාංශ ශීර්ෂය යටතේ වැයකර තිබුණි. අධ්‍යාපන සේවා අමාත්‍යාංශය විසින් පරිහරණය කරන යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන 09 ක නඩත්තු වියදම් ලෙස එකතුව රු.3,942,247 ක් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වැය කර තිබුණි. එම වාහන 09 අධ්‍යාපන සේවා අමාත්‍යාංශය වෙත පවරා ගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට හෝ ආපසු භාරදීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 1.5 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) අමාත්‍ය මණ්ඩල තීරණ | | |
| (i) 2009 මැයි 13 දිනැති අංක අමප/09/0736/316/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | | අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයකර තිබුණු පරිදි පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 42 ක සීමාව ඉක්මවා, 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වාවූ පන්තිවලට වරින් වර ළමුන් ඇතුළත් කර තිබීම හේතුවෙන්, 2013 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 31 ක 5 ශ්‍රේණියේ පන්තිවල සිටිය යුතු ළමුන් සංඛ්‍යාවට වඩා ළමුන් 1,250 ක් සිටින බව සිදුකරන ලද නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 42 ක සීමාව ඉක්මවා, ළමුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, මාතර දිස්ත්‍රිකයේ ජාතික පාසලකට ළමුන් 35 දෙනෙකු ඇතුළත් කර ඇති බවට විගණකාධිපතිවරයා වෙත ලැබී තිබුණු නියෝජනය පරීක්ෂා කිරීමට අදාළ තොරතුරු හා ලිපිගොනු විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |
| (ii) 2011 පෙබරවාරි 10 දිනැති අංක අමප/11/0017/530/0 | | විශේෂ විමර්ශණ ඒකකයක් ස්ථාපනය කිරීම වෙනුවට විමර්ෂණ ඒකකය ශක්තිමත් කිරීම කළ යුතු බවට වූ |

03 දරන අමාත්‍ය මණ්ඩල තීරණය

අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි විශේෂ විමර්ෂණ ඒකකය ස්ථාපිත කර තිබුණි. එම ඒකකය වෙත අනුමත නොවූ විමර්ෂණ නිලධාරී තනතුරු සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ, ශ්‍රී ලංකා අධ්‍යාපනඥ සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් 20 දෙනෙකු සහ අධ්‍යක්ෂවරයෙකු අනුයුක්ත කර තිබුණු නමුත් විමර්ශන ඒකකය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

----------------------------

(i) XII පරිච්ඡේදයේ 1, 2 හා 3 වගන්ති

(i) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසල් දෙකක, මහනුවර හා මාතර දිස්ත්‍රික්කවල ජාතික පාසල් දෙකක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 89 දෙනෙකු විසින් අනුමැතියකින් තොරව එකතුව දින 1,077 ක නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) කොළඹ හා මාතර දිස්ත්‍රික්කවල ජාතික පාසල් දෙකක නිවාඩු ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබීම, කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ප්‍රමාදවී සේවයට වාර්තා කිරීම පුරුද්දක් කරගෙන සිටින අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පාලනය සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් සේවකයින් 05 දෙනෙකුගේ එකතුව දින 74ක වැටුප් රහිත නිවාඩු සඳහා වැටුපෙන් අයකර ගෙන නොතිබුණි.

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ගුරුභවතුන් 4 දෙනෙකු විසින් 2011 හා 2012 වර්ෂවලදී ලබාගෙන තිබුණු වැටුප් රහිත දින 346 ක් වෙනුවෙන් ලබාගෙන තිබුණු වැටුප් ආපසු අයකර ගෙන නොතිබුණි. ව්‍යාජ තොරතුරු ඉදිරිපත්

කරමින්, වර්ෂ 13 ක් තිස්සේ අඛණ්ඩව වැටුප් රහිත නිවාඩු ලබා තිබුණු සමහර ගුරුභවතුන් වෙත අඛණ්ඩව වැටුප් වර්ධකද ලබාදී තිබුණි.

7 වගන්තිය

කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක විදුහල්පතිගේ අනුමැතියකින් තොරව සේවකයින් තිදෙනෙකු රජයේ නිවාඩු දින 76 ක් සේවයේ යොදවා තිබුණු අතර එම නිවාඩු දින 76 න් 72 ක් වෙනුවෙන් හිලව් නිවාඩු ලබාගෙන තිබුණි.

(ii) XVIII පරිච්ඡේදය

ආයතන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නේවාසිකාගාර පාලක නිල නිවාස කුලී අයකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

------------------------------

(i) මුදල් රෙගුලාසි 104, 105, 107 හා 109

(i) සමාලෝචිත වර්ෂය තුළදී අනතුරට ලක්වී තිබුණු කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක් සතු වාහන 03 ක් හා 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී අනතුරට ලක්වී තිබුණු අමාත්‍යාංශය සතු වාහන 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 1991 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ජාතික පාසල් හා අමාත්‍යාංශය යටතේ වූ විවිධ ආයතනවල අවස්ථා 48 කදී සිදුවී තිබුණු විවිධ අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371

ජාතික පාසැල් 06 ක සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වන පරිදි 2008 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අවස්ථා 414 කදී එකතුව

| | | | |
|---|---|---|---|
| | | | රු.4,549,873 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව එම අග්‍රිම පියවා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 384(2) | | කොළඹ හා මහනුවර දිස්ත්‍රික්කවල ජාතික පාසල් දෙකක පාසල් සංවර්ධන සමිති ගිණුම්වලින් ගෙවීම් කිරීමේදී චෙක්පත් රේඛණය කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 395 (ඇ) (ඈ) (ඌ) | | කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක පාසල් සංවර්ධන සමිති බැංකු ජංගම ගිණුම වෙනුවෙන්, සෑම මාසයක් අවසන් වී ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 387 | | කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පැසලක් විසින් 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් එකතුව රු.3,806,579 ක් සහ රු.3,839,130 ක් වශයෙන් බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 283,109 | කොළඹ රාජකීය විද්‍යාලයීය ශිෂ්‍ය නේවාසිකාගාරය වෙනුවෙන් පවත්වා තිබුණු ජංගම ගිණුමෙන් නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් කල් ඉකුත් වූ චෙක්පත් 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි . |
| (vii) | මුදල් රෙගුලාසි 1645 (අ) සහ (ආ) | | කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක් සතු වාහනවල ධාවන සටහන් හා ඉන්ධන ලේඛණය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ඉන්ධන අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමේ ලේඛණය අනුව, සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු ඉන්ධනවල වටිනාකම රු.1,034,835 ක් වුවද, ධාවන සටහන්වලට අනුව පාවිච්චිකර තිබුණු ඉන්ධනවල වටිනාකම රු.795,871 ක් පමණක් විය. ඒ අනුව හඳුනාගත් ඉන්ධන ඌනතාවයේ වටිනාකම රු.233,264 ක් විය. තවද රු.44,000 කට නව ටයර් 04 ක් සවිකර වාහනයක් වෙන්දේසියට ඉදිරිපත් කර තිබුණි. |

(ඇ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 3.4 හා 4 ඡේද | 3,689,193 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පාවිච්චි කළ හැකි වාහන ප්‍රමාණයට වඩා වැඩියෙන් අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් විසින් වාහන 03 ක් පාවිච්චි කර රු.1,289,279 ක් අළුත්වැඩියා සඳහා වැයකර තිබුණි. චක්‍රලේඛයෙහි දක්වා ඇති ඉන්ධන සීමාව ඉක්මවා, ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී නිල වාහනයක් හා ආරක්ෂක රථ 02ක් සඳහා එකතුව රු.2,399,914 ක ඉන්ධන නිකුත් කර තිබුණි. |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2010 මැයි 24 දිනැති අංක 08/2010 දරන චක්‍රලේඛයේ 02 වගන්තිය | 1,230,871 | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් 08 දෙනෙකු වෙත වෙන්කළ වාහන 08 ක් වෙනුවෙන් නිකුත් කළ යුතු ඉන්ධන සඳහා රු.1,676,232 ක් නියමිත පරිදි වැටුපට එකතු කර ගෙවා තිබියදී, ඊට අමතරව නිකුත් කර තිබුණු ඉන්ධනවල වටිනාකම රු.1,230,871 ක් විය. |

**(ඊ)** අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ

| | | |
|---|---|---|
| **(i)** 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛය | | (i) චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන පරිදි, වැඩි ශිෂ්‍යත්ව ලකුණු ලබා ගෙන තිබුණු සිසුවියන් 10 දෙනෙකු පාසැලට ඇතුළත් නොකර, අඩු ලකුණු ලබාගත් සිසුවියන් 10 දෙනෙකු ඇතුළත් කර ගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක බලධාරීන් කටයුතු කර තිබුණි.<br>(ii) චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉංග්‍රීසි මාධ්‍ය හා සිංහල මාධ්‍ය ලෙස වර්ග කරමින් පන්ති පැවැත්වීම කළ නොහැකි වුවද, කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක එසේ මාධ්‍ය දෙකට වෙන වෙනම පන්ති පවත්වා තිබුණි. ශිෂ්‍යත්ව විභාගයෙන් අඩු ලකුණු ලබාගෙන ඇති සිසුවියන්ගේ අයදුම්පත් ඉංග්‍රීසි මාධ්‍යට |

යොමු කර ඉංග්‍රීසි මාධ්‍ය පන්තියට ඇතුළත් වීමට අවස්ථාව උදාකර දීම නිසා ශිෂ්‍යත්ව විභාගය සඳහා ඉහළ ලකුණු ලබාගෙන සිංහල මාධ්‍යයෙන් පාසලට ඇතුළත් වීමට අයදුම්පත් යොමු කළ සිසුවියන් හට පාසලට ඇතුළත්වීමේ අවස්ථාව විද්‍යාලයීය බලධාරීන් විසින් අහිමි කර තිබුණි.

(ii) 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය 2.1 ඡේදය

(i) නවක ගුරුවරු පාසල්වලට අනුයුක්ත කිරීමේදී නිසි ප්‍රතිපත්තියකට අනුව කටයුතු නොකිරීම හා ගුරුමාරු ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන්, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව හඳුනාගෙන තිබුණු සමස්ථ ජාතික පාසැල් පද්ධතියේ පවතින එකිනෙක විෂයයන්ට අදාළ ගුරු ඌනතා 2,096 ක් හා අතිරික්තතා 5,078 අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අතරින් 2013 දෙසැම්බර් 31 දින වන විට මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක උසස් පෙළ භූගෝලය, බෞද්ධ සංස්කෘතිය, ඉංග්‍රීසි හා තාක්ෂණ විෂය ඉගැන්වීමට එකම ගුරුභවතෙකු හෝ අනුයුක්ත කර නොතිබුණි.

(ii) චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සිටිය යුතුයැයි හඳුනාගෙන තිබුණු විශේෂ අධ්‍යාපන ශික්ෂණ ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් සංඛ්‍යාව සමඟ සැසඳීමේදී 2013 දෙසැම්බර් 31 දින වන විට එම ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 476 ක් විය. එදිනට තථ්‍ය ගුරුභවතුන් සංඛ්‍යාව නිසි ලෙස අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් 1,145 ක් ඉගෙනුම ලබන පාසැල් 128 කට විශේෂ අධ්‍යාපන ශික්ෂණ ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් කිසිවෙකු අනුයුක්ත කර නොතිබුණු නමුත් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් කිසිවෙකු නොමැති පාසල් 162ක් වෙත එවැනි ගුරුභවතුන් 176 දෙනෙකු අනුයුක්ත කර තිබුණි.

2.2 ඡේදය

(i) චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක් සඳහා අනුමත නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා සහකාර විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා නියෝජ්‍ය විදුහල්පතිවරු දෙදෙනෙකු හා සහකාර විදුහල්පතිවරු දසදෙනෙකු පත්කර තිබුණි. නියෝජ්‍ය විදුහල්පති තනතුරු දරන තිදෙනෙකු හා සහකාර විදුහල්පති තනතුරු දරන එකොළොස්

දෙනෙකු විධිමත් පරිදි පත් කර නොතිබුණි.

(ii) නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා සහකාර විදුහල්පතිවරුන් වෙත සතියකට අවම වශයෙන් පිළිවෙලින් කාලපරිච්ඡේද 10 ක් හා 12 ක් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත්, කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක විධිමත් පත්වීම් ලද හා නොලද නියෝජ්‍ය විදුහල්පතිවරුන් පස්දෙනා සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි. එසේම එක් නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතුවල නිරත කර නොතිබුණි. එසේම විධිමත් පත්වීම් නොලද සහකාර විදුහල්පතිවරුන් එකොලොස් දෙනෙකු සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.

(iii) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් තිදෙනා, සහකාර විදුහල්පතිවරයා සහ මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් දෙදෙනා වෙත ඉගැන්වීම් කටයුතු සඳහා එකම කාල පරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණි.

| | |
|---|---|
| 2.1.2. හා 2.1.3 ඡේද | අධීක්ෂණ කාර්යයේ නියුතු හා විෂයය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් වෙත පිළිවෙලින් සතියකට අවම වශයෙන් කාලපරිච්ඡේද 16 ක් හා 35 ක් ඉගැන්වීමේ රාජකාරි පවරා තිබිය යුතු වුවද, කොළඹ, මහනුවර හා මාතර දිස්ත්‍රික්කවල ජාතික පාසැල් 5 ක නියමිත කාලපරිච්ඡේද සංඛ්‍යාවට වඩා අඩු කාලපරිච්ඡේද සංඛ්‍යාවක් ලබාදී තිබුණු ගුරුභවතුන් සංඛ්‍යාව 383 ක් විය. |
| (iii) 2007 දෙසැම්බර් 31 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පාසැලක උපරිම සේවා කාලය වර්ෂ 06 සීමාව ඉක්මවූ ගුරුභවතුන් ස්ථාන මාරුකර නොතිබුණි. ඒ හේතුවෙන්, |

(i) කොළඹ අධ්‍යාපන කලාපයට අයත් ජාතික පාසැල් 20 ක ගුරුභවතුන් 512 ක් වර්ෂ 11-30

| | | |
|---|---|---|
| | | ත් අතර කාලයක්ද,<br>(ii) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ගුරුභවතුන් 48 දෙනෙකු වර්ෂ 12 – 27 ත් අතර කාලයක්ද,<br>(iii) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ගුරුභවතුන් 19 දෙනෙකු වර්ෂ 13 - 26 ත් අතර කාලයක්ද,<br>(iv) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ගුරුභවතුන් 56 දෙනෙකු වර්ෂ 10 - 30 ත් අතර කාලයක්ද<br>(v) කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක ගුරුභවතුන් 18 දෙනෙකු වර්ෂ 11 – 31 ත් අතර කාලයක්ද,<br>(vi) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ගුරුභවතුන් 29 දෙනෙකු වර්ෂ 9 - 25 ත් අතර කාලයක්ද,<br>(vii) මාතර දිස්ත්‍රික්කයේ බාලිකා විද්‍යාලයක ගුරුභවතුන් 21 දෙනෙක් වර්ෂ 12 - 26 අතර කාලයක්ද,<br>ස්ථාන මාරුවීම් නොලබා සේවයේ යෙදී තිබුණි. |
| (iv) 2009 ජුනි 30 දිනැති අංක 2009/20 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 5,393,000 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව, කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක බලධාරීන් විසින් ක්‍රීඩා පුහුණුකරුවන් 32 ක් බඳවා ගෙන එකතුව රු. 5,393,000 ක දීමනා ගෙවා තිබුණි. |
| (v) 2007 පෙබරවාරි 28 දිනැති අංක 2007/04 දරන චක්‍රලේඛය | 1,740,000 | සියලුම ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ලබාගැනීමට හැකිවන අයුරින් ශිෂ්‍යයින් සම්බන්ධව ඉදිරිපත් කළ යුතු සියළු තොරතුරු සම්පූර්ණ කර යවා නොතිබීම හේතුවෙන්<br>(i) කොළඹ දිස්ත්‍රිකයේ ජාතික පාසලක සිසුන් 282 ක් වෙත රු.243,000 ක්ද,<br>(ii) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක සිසුන් 10 ක් වෙත රු.21,000 ක්ද, |

| | | |
|---|---|---|
| | | (iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක සිසුන් 328 වෙත රු.1,476,000 ක්ද වශයෙන් ශිෂ්‍යාධාර අහිමිවී තිබුණි. |
| (vi) 2007 ජනවාරි 10 දිනැති අංක 2007/02 දරන චක්‍රලේඛය | | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සිසුන්ගේ පාරිභෝජනය සඳහා පලතුරු වර්ග, මුං ඇට , කඩල, කව්පි වැනි ධාන්‍ය වර්ග ඇතුළු පෝෂ්‍යදායී හා දේශීය ආහාර වර්ග ලබාදිය යුතු නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නේවාසික සිසුන්ගේ පරිභෝජනය සඳහා එවැනි ආහාර වර්ග වෙනුවට පාන්පිටි භාවිතා කර නිෂ්පාදිත ආහාර වර්ග මිලදී ගෙන තිබුණි. සතිපතා ආහාර සටහන් පිළියෙල කර සිසු දරුවන්ගේ දැනගැනීම සඳහා ප්‍රදර්ශනය කර නොතිබුණි. තවද එම විද්‍යාලයීය ආපන ශාලාවල සියළුම කෙටි ආහාර වර්ග පාන්පිටිවලින් සාදන ලද ඒවා විය. |
| (vii) 2001 ඔක්තෝබර් 08 දිනැති අංක 2001/24 දරන චක්‍රලේඛය | 685,970 | කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක් වෙත සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.555,970 ක් වටිනාකම වූ භාණ්ඩ පරිත්‍යාග ලේඛණයේ හා ඉන්වෙන්ට්‍රි ලේඛණයේ සටහන් කර නොතිබුණු අතර ඉන් රු.130,000 ක් වටිනා භාණ්ඩ 2014 පෙබරවාරි 20 දින පවත්වන ලද භෞතික පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට අදාළ බලධාරීන් අපොහොසත් විය. |
| (viii) 1975 නොවැම්බර් 05 දිනැති අංක 57/75 දරන චක්‍රලේඛය | 4,348,860 | (i) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක සිසුන්ගෙන් වාර්ෂිකව අයකරනු ලබන පාසල් සංවර්ධන සමිති ගාස්තු සහ පහසුකම් හා සේවා ගාස්තු අදාළ වර්ෂයන්හිදී නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සිසුන් 525 ක ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු හිඟ මුදල රු.4,348,860 ක් විය.<br>(ii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක පහසුකම් හා සේවා ගාස්තු වෙනුවෙන් අනුමත අයවැය ලේඛණයක් නොතිබීම, සිව් මාසික ගිණුම් |

සාරාංශ අදාළ අංශ වෙත ඉදිරිපත් කර නොතිබීම, පහසුකම් හා සේවා ගාස්තු ගිණුමෙන් වියදම් කළ හැකි වියදම් වර්ගීකරණයන්වලට අයත් නොවන වියදම් සඳහා රු.89,000 ක් ගෙවා තිබීම වැනි කරුණු නිරීක්ෂණය වූ අතර පහසුකම් හා සේවා ගාස්තු ආදායම රැස්කිරීම සඳහා පවත්වා තිබුණු බැංකු ජංගම ගිණුමෙහි වර්ෂයේ සාමාන්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් ඉක්මවා ආදායම් ඉපයීමකින් තොරව රු.ලක්ෂ 12 කට වැඩි මුදලක් රඳවාගෙන තිබුණි.

(iii) චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක් විසින් පළමු වසරට සිසුන් 03 දෙනෙකු ඇතුළත් කර තිබුණි.

## 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### (අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) දැනුම කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.232,455,060 ක් හා රු.626,684,325 ක්වූ ප්‍රතිපාදන සළසා තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය සියයට 84 ක් වූ නමුත් එය සමාලෝචිත වර්ෂයේදී සියයට 38ක් පමණක් විය. ඒ අනුව ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සපයා තිබුණු මුළු අරමුදල් වලින් සියයට 62 කට සමාන රු.384,832,149 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ මූල්‍ය ප්‍රගතිය සියයට 51ක් පමණක් වූ අතර, ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් සපයා තිබුණු මුළු අරමුදල්වලින් සියයට 49 කට සමාන රු.420,786,511ක් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී විද්‍යාගාර 859ක් ඉදිකිරීම සඳහා රු.4,364,105,710 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර 2013 දෙසැම්බර්

31 දින වන විට තථ්‍ය වියදම රු4,106,338,371 ක් විය. සැලැසුම්කර තිබුණු පරිදි 2013 දෙසැම්බර් 31 දින වන විට විද්‍යාගාර 859 හි වැඩ අවසන් කර තිබිය යුතු නමුත් එදිනට වැඩ අවසන්කර තිබුණු විද්‍යාගාර ප්‍රමාණය 380 ක්විය. මූල්‍ය ප්‍රගතිය සියයට 94 ක් වුවද, විද්‍යාගාර 479 ක වැඩ අවසන් කර නොතිබුණු බැවින් භෞතික ප්‍රගතිය සියයට 44 ක් පමණක් විය.

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක භූමියේ 2004 වර්ෂයට පෙරදී, ඉදිකිරීම් ආරම්භ කර තිබුණු ගොඩනැගිල්ලේ දෙවන මහල හා අඩක් නිමකර තිබුණු තවත් ගොඩනැගිලි දෙකක දෙවන අදියර ආරම්භ කර නොතිබීම හේතුවෙන් දෙවන අදියර සඳහා මතුකර තිබුණු කම්බි වර්ෂ 10 ක පමණ කාලයක සිට දිරාපත් වෙමින් තිබුණි. තවත් තෙමහල් ගොඩනැගිල්ලක ඉදිකිරීමේ කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කර පළමු හා දෙවන අදියර අවසන්කර තිබුණු නමුත් තෙවන අදියර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් දෙවන මහල ප්‍රයෝජනයට ගත නොහැකිවී තිබුණි. තෙවන අදියර සඳහා අවශ්‍ය රු.8,059,501 ක් අමාත්‍යාංශ පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණු නමුත් අදාළ අනුමැතීන් ලැබී නොතිබුණු බැවින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

1.7 කාර්යසාධනය
----------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්
------------------------------------------------------

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) ʺයුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලʺ නම් වූ අරමුදලක් පිහිටුවා තිබුණු අතර අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරා තිබුණි. අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකරගැනීම සඳහා 1999 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා රැස්කර තිබුණු රු.10,290,430 ක්වූ අරමුදල් උපයෝජනය කරමින් එම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

(ii) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා අධ්‍යාපනඥ සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය සහ ශ්‍රී ලංකා ගුරු සේවය යන සේවා හතරට අදාළ සේවා ව්‍යවස්ථා පිළියෙල කර අනුමත කරවා ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) දිගුකාලීන කාල ප්‍රමාදයන් සහිතව ඉටුකර නොතිබුණු කාර්යයන්

-------------------------------------------------------------------

1985 වර්ෂයේදී පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබුණු බ්‍රේල් මුද්‍රණ යන්ත්‍ර නිසි නඩත්තුවක් නොකිරීම හේතුවෙන් අකර්මන්‍ය වී තිබුණි. පසුකාලීනව මිලදී ගෙන තිබුණු යන්ත්‍ර අළුත්වැඩියාවන්වල දීර්ඝ ප්‍රමාදයන් පැවතීම, අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම නිවැරදි වේලාවට සිදුකර නොතිබීම හා කාර්ය මණ්ඩල ඌනතා වැනි හේතු නිසා, දෘශ්‍යාබාධිත සිසුන්ට 2013 වර්ෂයේදී මුද්‍රණය කර බෙදාහැරිය යුතුව තිබුණු බ්‍රේල් පෙළපොත් 3,220 න් පොත් 1,957 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටද, 2014 වර්ෂය සඳහා මුද්‍රණය කර බෙදාහැරිය යුතුව තිබුණු බ්‍රේල් පෙළපොත් 1,914 න් පොත් 656 ක් 2014 පෙබරවාරි 20 දින වන විටද මුද්‍රණය කර නොතිබුණි.

(ඇ) පාසැල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන

---------------------------------------------

පාසැල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන ලබාදීම සඳහා පළමු අදියරට තෝරාගත් ජාතික පාසැල් 50ක් හා පළාත් පාසැල් 359ක් වශයෙන් පාසැල් 409 කට ඉකුත් වර්ෂයේදී එකතුව රු.162,400,000 ක ප්‍රදානද, දෙවන හා තෙවන අදියරයන් සඳහා තෝරාගත් ජාතික පාසැල් 132ක් හා පළාත් පාසැල් 466ක් වශයෙන් පාසැල් 598ක් වෙත සමාලෝචිත වර්ෂයේදී රු.89,550,000 ක ප්‍රදානද ලබාදී තිබුණි. ප්‍රදාන උපයෝජනය කිරීම සිදු කළ විදුහල්පති විසින් පිළියෙල කළ යුතු ව්‍යාපෘති යෝජනා සැලැස්ම, අන්තර් කාලීන වාර්තා හා සමස්ථ ප්‍රගතිය පිළිබඳ වාර්තා කිසිවක් අදාළ පාර්ශවයන් වෙතින් ලබා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රදාන ලබාදීමේ අරමුණු ඉටුකිරීම පිළබඳ මූල්‍ය හා භෞතික ප්‍රගතිය සමාලෝචනය කිරීමට නොහැකි වී තිබුණි.

1.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-----------------------------------------

(අ) අක්‍රීය බැංකු ගිණුම්

----------------------

අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලැබූ බැංකු ජංගම ගිණුම් 08ක් 2013 දෙසැම්බර් 31 දින වන විට වසර 06 ක කාලයක සිට අක්‍රීයව තිබුණු අතර, ඉන් ගිණුම් 03 කට අදාළව අක්‍රීයව පැවති ශේෂ එකතුව රු.1,192,335 ක් විය. 2007 සැප්තැම්බර් 05 දිනැති අංක 2007/05 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි (1) ඡේදයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම බැංකු ගිණුම් 08 වසා දමා නොතිබුණි.

(ආ) ගැලපුම් කළයුතු ශේෂ

--------------------------

ඉදිරිපත් කර තිබුණු විසර්ජන ගිණුමේ සටහන් අංක (iv)(ආ) හි දක්වා තිබුණු පරිදි, නිකුත් කළ නමුත් කල් ඉකුත්වූ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත්වල වටිනාකම රු.1,709,647 ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.9 අවිධිමත් ගනුදෙනු

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම් අනාවරණය විය.

(i) කොළඹ, මහනුවර හා මාතර දිස්ත්‍රික්කවල ජාතික පාසැල් තුනක් විසින් අවස්ථා 31 කදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර එකතුව රු.4,070,374 ක භාණ්ඩ හා සේවා මිලදී ගෙන

තිබුණි. මෙම භාණ්ඩ හා සේවා අවම මිලට මිලදී ගත් බව දක්වා තිබුණද, එම අවස්ථා 31 සඳහා ඉදිරිපත් කළ ලිපිගොනුවල ඇති තොරතුරු සාවද්‍ය විය.

(ii) ලිඛිත ගිවිසුමකින් තොරව මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක වැසිකිළි පද්ධතියක් අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම සඳහා තෝරා ගෙන තිබුණු ආයතනයක් වෙත රු.575,000 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත් ලිපිගොනු පවත්වා නොතිබුණු අතර එම ආයතනය විසින් එවා තිබුණු ලංසු පමණක් විගණනය සඳහා ඉදිරිපත් කිරීම හේතුවෙන් අනුගමනය කර තිබුණු ප්‍රසම්පාදන පරිපාටියේ විනිවිදභාවයේ නිවැරදි බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව,කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නව රඟහල පිහිටි ගොඩනැගිල්ල අලුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පාසැල් සංවර්ධන සමිති ගිණුමෙන් රු.3,430,390 ක් වැයකර තිබුණු අතර අළුත්වැඩියාව සඳහා වියදම් ඇස්තමේන්තු හා ප්‍රමාණ බිල්පත් පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාර බලය නොමැතිවූ ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පති නිල නිවාසයට අදාළ විදුලි බිල්පත් සඳහා එකතුව රු.141,410 ක් පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් ගෙවා කර තිබුණද, එම මුදල අදාළ නිලධාරියාගෙන් අයකර ගෙන නොතිබුණි.

(ii) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක බලධාරීන් විසින් පාසලේ විවිධ කටයුතු සඳහා අනුමැතියකින් තොරව 2012 හා 2013 වර්ෂවලදී පිළිවෙලින් රු.4,339,050 ක් හා රු.6,926,120ක් දෙමාපියන්ගෙන් රැස්කර ගැනීමට කටයුතු කර තිබුණි. මීට අමතරව 2013 වර්ෂයේදී විවිධ ප්‍රසංගයක් පැවැත්වීමට, සිසු දරු දැරියන්ට හා දෙමාපියන්ට බලපෑමක් නොවන පරිදි මුදල් රැස්කළ හැකිද යන්න පිළිබඳව සළකා නොබලා අනුමැතිය ලබාදීම මත රු.3,502,500ක් දෙමාපියන්ගෙන් රැස්කර තිබුණි.

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක බලධාරීන් විසින් 2014 වර්ෂය තුළ අවස්ථා දෙකකදී කිසිදු නීත්‍යානුකූල පදනමකින් තොරව, සිසු දරුවන්ගෙන් රු.636,000 ක් ලදුපත් නිකුත් කිරීමකින් තොරව එකතු කර, පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර නොකර නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු භාරයේ තබාගෙන බිල්පත් හා ලදුපත් මඟින් වියදම තහවුරු නොකර විවිධ කටයුතු සඳහා වියදම් කර තිබුණි. එම කටයුතු සඳහා පාසැල් සංවර්ධන සමිතිය විසින්ද රු.145,985 ක් වැයකර තිබුණි.

(iv) 2011 සහ 2012 වර්ෂවලදී මාතර දිස්ත්‍රික්කයේ පාසලක පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී එක් එක් වර්ෂයේදී පිළිවෙලින් එක් ළමයෙකුගෙන් රු.7,000ක් හා රු.5,000 බැගින් ලබාගැනීමට කටයුතු කර තිබුණි. 2011 වර්ෂය තුළදී එසේ රැස්කළ මුදල හෝ එම මුදල් වියදම් කළ ආකාරය පිළිබඳ කිසිදු වාර්තාවක් ඉදිරිපත් නොකෙරුණු අතර 2012 වර්ෂය තුළදී මෙමගින් ලැබී තිබුණු මුදල රු.463,000 කින් රු.70,000 ක් බාහිර පුද්ගලයෙකු විසින් අත රඳවාගෙන තිබුණි.

(v) මාතර දිස්ත්‍රික්කයේ පාසලක ආදි ශිෂ්‍ය සංගමය ක්‍රීඩා සංවර්ධන අරමුදලක් පිහිටුවා තිබුණු අතර, එම සංගමයට ටිකට්පත් මුද්‍රණය කර මුදල් එකතු කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අනුමැතිය ලබාදී තිබුණි. ක්‍රීඩා සංවර්ධන අරමුදල වෙනුවෙන් රු. 20 බැගින් වූ ටිකට් පත් මුද්‍රණය කර අලෙවි කර තිබුණි. මුද්‍රණය කරන ලද ටිකට් පත් ප්‍රමාණය, අලෙවි කරන ලද ටිකට් පත් ප්‍රමාණය හා ඉතිරි වූ ටිකට්පත් ප්‍රමාණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ක්‍රීඩා සංවර්ධන අරමුදලේ ලේකම්වරයා විසින් මාසයේ අවසන් දිනට රු.50,000 කට වැඩි මුදල් ශේෂයක් අත රඳවාගෙන තිබූ අවස්ථා 21ක් විය.

(vi) තායිලන්ත රජයෙන් ලැබී තිබුණු ආරාධනාවක් අනුව, 2012 අගෝස්තු 21 දින සිට 28 දින දක්වා කාලය තුළදී පවත්වා තිබුණු විදේශ අධ්‍යාපන වැඩමුළුවක් සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ගුරුභවතුන් 31 දෙනෙකු විදේශගත වී තිබුණු අතර අවශ්‍ය අරමුදල් පාසැලේ ලිපි ශීර්ෂ භාවිතා කරමින් වෙළඳ ආයතනවලින් ලබාගෙන තිබුණි. නමුත් නියමිත දිනට දිවයිනෙන් පිටත් නොවීම හේතුවෙන් වැඩමුළුවට සහභාගීවීමට නොහැකිවී තිබුණු බව සහභාගීවූ ගුරුවරුන්ගේ ප්‍රකාශ මඟින් තහවුරු විය.

(vii) පිහිනුම් තටාකයක් ඉදිකිරීම සඳහා ඉහත සඳහන් පාසලේ සිසුන් හා ගුරුවරුන් යොදවා එක් සිසුවෙකුගෙන් රු.2,000 බැගින් හා විවිධ පාර්ශවයන්ගෙන් රු.6,960,750 ක් රැස්කර තිබුණි. නමුත් පිහිනුම් තටාකය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2013 ජූලි වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) වෙනත්

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදි මහින්දෝදය විද්‍යාපීඨ 150 ක් සඳහා අවශ්‍ය ලී බඩු උපකරණ සපයා සවිකිරීමට රු.199,285,500 ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම, සැලසුමකින් තොරව, එම විද්‍යාපීඨ 150 ක් සඳහා අවශ්‍ය ලීබඩු උපකරණ සපයා සවිකිරීම සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.199,285,500 ක කොන්ත්‍රාත් 06 ක් සමාලෝචිත වර්ෂය තුළදී පිරිනමා තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, නියමිත දිනට ලීබඩු සපයා අවසන්කර නොතිබුණු නමුත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සහ ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවෙන් කොටසක් ලෙස ලැබී තිබුණු ලීබඩුවලට අදාළව ප්‍රමිති සහතික ලබාගෙන නොතිබුණු අතර ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රථම ලී බඩු ලැබී තිබීම හේතුවෙන් සවිකිරීම් නිමකිරීමට නොහැකිව පාසැල් ගොඩනැගිලි කොරිඩෝවල හා අනෙකුත් ස්ථානවල අනාරක්ෂිතව ගොඩගසා තිබුණු අතර අධ්‍යාපන කටයුතුවලටද මෙය බාධාවක් වී තිබුණි.

(ii) නිසි සැලැසුමකින් තොරව, රු.10,322,314 ක් වැය කර 2013 පෙබරවාරි මාසය වන විට මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර 17 ක් සඳහා ලී බඩු උපකරණ සපයා තිබුණු නමුත්, 2014 මාර්තු 31 දින වන විටත් විද්‍යාගාර ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් එම ලී බඩු උපකරණ පාසැල්වල විවිධ ස්ථානවල අනාරක්ෂිතව ගොඩගසා තිබුණු අතර අධ්‍යාපන කටයුතුවලටද මෙය බාධාවක් වී තිබුණි.

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක පොත්හල සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව සහ අලෙවි වන ප්‍රමාණය ගැන පුරෝකථනයකින් තොරව ඉකුත් වර්ෂය හා

සමාලෝචිත වර්ෂය තුළදී රු.6,203,772 ක අලෙවි භාණ්ඩ මිලදී ගෙන තිබුණි. ඉකුත් වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ගිණුම්වලට අනුව පොත්හලෙහි මුළු විකුණුම් ආදායම රු.4,803,035 ක් හා දළ ලාභය රු. 2,475,619 විය. දළ ලාභ ප්‍රතිශතය පිරිවැයට සියයට 5 ක් බව තීරණය කර භාණ්ඩ අලෙවි කර තිබුණු නමුත් තථ්‍ය දළ ලාභය සියයට 52 ක් වැනි අසාමාන්‍ය ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iv) පාසැල් 62ක් වෙනුවෙන් මිලදී ගෙන තිබුණු විවිධ කාර්යාල උපකරණ සෘජුවම පාසැල් වෙත සැපයූ බවට ලැබී තිබුණු විදුහල්පති නිල මුද්‍රාව රහිත භාණ්ඩ ලැබීම් පත්‍ර මත අදාළ සැපයුම්කරු වෙත රු.5,876,109ක ගෙවීම් කර තිබුණි.

1.10 සාවද්‍ය ස්වරූපයේ ගනුදෙනු
----------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ සාවද්‍ය ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නේවාසිකාගාරය වෙනුවෙන් විද්‍යාලයේ නමින් බැංකු ජංගම ගිණුමක් විවෘත කර තිබුණි. නියැදිය ලෙස තෝරාගත් 2013 ජනවාරි 01 දින සිට 2014 පෙබරවාරි 24 දින දක්වාවූ කාලපරිච්ඡේදය තුළදී විද්‍යාලයේ නේවාසිකාගාරයට අමු ආහාර සපයන බව ප්‍රකාශ කර ව්‍යාජ ඉන්වොයිස් පිළියෙල කර, ව්‍යාජ සැපයුම්කරුවෙකු නමින් රේඛනය නොකරන ලද මුදල් චෙක්පත් 20 කින් මුදල් ලබා ගෙන තිබුණු අතර එම කාලපරිච්ඡේදය තුළදී පමණක් රු.484,494 ක් අවභාවිතයට ගෙන තිබුණි.

(ආ) 2010 ජනවාරි 01 දින සිට 2014 මාර්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී, මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක නේවාසිකාගාරයේ නේවාසිකව සිටින සිසු දරුවන්ගෙන් නේවාසිකාගාර ගාස්තු අයකර බැංකුගත නොකර, පෞද්ගලික පරිහරණය සඳහා යොදාගනිමින් රු.1,287,650ක් අවභාවිතයට ගෙන තිබුණි.

(ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක පාසැල් සංවර්ධන කමිටුවේ දෛනික ආදායම් ලෙස ලැබී තිබුණු ලදුපත් 08 කට අදාළ එකතුව රු.310,853 කින් රු.262,602 ක් පමණක් බැංකුගත කර තිබුණු අතර රු.48,251 ක් බැංකුගත කර නොතිබුණි.

1.11 පාඩු හා හානි
---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විවිධ කාලපරිච්ඡේදයන් තුළදී කොළඹ හා මාතර දිස්ත්‍රික්කවල ජාතික පාසල් හතරක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පාසැල් පුස්තකාලයෙන් බැහැරට පොත් රැගෙන ගොස් තිබුණත් එයින් පොත් 2,005ක් ආපසු භාරදී නොතිබුණි.

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ආපනශාලා හිමිකරු සමඟ එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, කුලී අයකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආපන ශාලා කුලී ආදායම රු.1,283,000 ක් වූ අතර අයකර නොතිබුණු විදුලි බිල්පත්වල මුළු වටිනාකම රු.372,598ක් විය. බාහිර පාර්ශවයක් වෙතින් පාසල වෙත ලැබී තිබුණු රු.300,000 ක්වූ ප්‍රදානයකින් හිඟ මුදලින් කොටසක් පියවීමට කටයුතු කර තිබුණි.

1.12 අනාර්ථික ගනුදෙනු

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණයවූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පරිගණක පහසුකම් සහිත පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීමේ අරමුණින් 2006 වර්ෂයේදී පාසල් පරිගණක ජාලය ස්ථාපිත කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට පාසල් ඇතුළු ආයතන 1,724 ක් වෙත සම්බන්ධතාවය ලබාදී තිබුණි. පෞද්ගලික ආයතනයක් හා රාජ්‍ය ආයතනයක් සමඟ මේ සම්බන්ධයෙන් එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, ජාලය ස්ථාපිත කිරීම සඳහා රු.37,090,000 කට ආසන්න මුදලක්ද, 2006 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී නඩත්තුව සඳහා රු.579,140,248 ක්ද වැයකර තිබුණු අතර ඒ තුළ රු.222,327,173 ක් සමාලෝචිත වර්ෂයට අදාළ විය. මෙම සේවාව භාවිතයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි තෘප්තියක් නොමැති බව පාසැල් හා ආයතන 414 ක්ම තහවුරුකර තිබුණි.මෙම පරිගණක ජාලය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දින වන විට රු.16,122,312 ක් වැයකරමින් ස්ථාපිතකර තිබුණු අධ්‍යාපනික කළමනාකරණ තොරතුරු පද්ධතියද අකර්මන්‍ය වී තිබුණි.

(ආ) අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය සඳහා තාක්ෂණික සහකාරවරයෙකු බඳවාගෙන රු.180,000 ක් දීමනා ගෙවා අරමුණු 06 ක් ඉටුකර ගැනීමට නිර්දේශ ලබාගෙන තිබුණු නමුත් එම නිර්දේශ ක්‍රියාත්මක නොකර රු.240,000ක දීමනා ගෙවීමේ පදනම මත 2014 වර්ෂයේදී නැවතත් එම නිලධාරියාවම බඳවා ගෙන තිබුණි.

(ඇ) දුෂ්කර හා අති දුෂ්කර හුදෙකලා පාසැල්වල ඉගෙනුම ලබන සිසුන්ට අතිරේක නිල ඇඳුම් කට්ටලයක් සහ පාවහන් යුගලයක් ලබාදීමට අමාත්‍ය මණ්ඩලය ගෙන තිබුණු තීරණය ක්‍රියාත්මක කිරීමේ වගකීම අධ්‍යාපන සේවා අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. පාවහන් යුගලය බහාලන ඇසුරුමේ මුද්‍රණය කිරීමට සුදුසු නිල ලාංඡනයක් පාසැල් සිසුන්ගේ නිර්මාණ මගින් ලබාගැනීමට අයදුම්පත් කැඳවමින් නිර්මාණ තරඟයක් පැවැත්වීමට පුවත්පත් 05 ක දැන්වීම් පළකිරීම හා අනෙකුත් කටයුතු වෙනුවෙන් රු.410,972 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණු නමුත් තරඟය පැවැත්වීමක් හෝ සපත්තු මිලදී ගැනීමක් හෝ සිදුකර නොතිබුණි.

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක කාර්ය මණ්ඩලය තුළ ස්ථිර සනීපාරක්ෂක කම්කරුවන් හත් දෙනෙකු හා අනියම් සනීපාරක්ෂක කම්කරුවන් දෙදෙනෙකු සහ ස්ථිර මුරකරුවන් පස් දෙනෙකු සිටියදී පාසලේ සනීපාරක්ෂක කටයුතු හා ආරක්ෂක කටයුතු පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් රු. 10,535,770 ක් ගෙවා තිබුණි. විද්‍යාල භූමියේ විශාලත්වය හා ඉගෙනුම ලබන සිසුන්, කාර්ය මණ්ඩලය හා දෛනිකව පැමිණෙන බාහිර පාර්ශවයන්ගේ ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කරමින් විද්‍යාලයේ සනීපාරක්ෂාව හා ආරක්ෂාව සඳහා මෙම කටයුතු පෞද්ගලීකරණය කර ඇති බවට අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අදහස් දක්වා තිබුණි.

(ඉ) ඉහත (ඈ) හි සඳහන් පාසලේ නව රඟහලේ ආදායමින් රු.1,870,256 ක් බැංකු ජංගම ගිණුමක රඳවා ගෙන තිබුණු අතර ක්ෂණික තැන්පතුවල තැන්පත් කර පොලී ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක පිහිනුම් තටාකයේ පිහිණුම් පුහුණුකරුට මසකට රු.35,000 බැගින් වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගෙන තිබියදී, 2013 වර්ෂයේදී බාහිර පාර්ශවයන් වෙතින් අයකර තිබුණු රු.1,016,758 කින් රු.762,569 ක් පුහුණුකරු ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඒ අනුව රු.254,189 ක් පමණක් පාසැලේ ආදායමට බැර කර තිබුණි. 2013 වර්ෂයේ තටාකයේ වියදම රු.686,481 ක් වී තිබුණු බැවින් තටාකයේ සමස්ථ අලාභය රු.432,292 ක් වී තිබුණි.

(උ) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසලක පිහිනුම් තටාකයක් ඉදිකර වර්ෂ 3කට අධික කාලයක් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂයේදි පාසැලේ ශිෂ්‍යයින් 80 දෙනෙකු පමණක් පිහිනුම් පුහුණුවීම් සඳහා ලියාපදිංචිවී තිබුණි. 2013 ජනවාරි සිට නොවැම්බර් දක්වාවූ කාලපරිච්ඡේදය තුළදී බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබුණු

ආදායම රු.957,400 ක්වූ අතර මුළු වියදම රු.1,324,311 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ පිහිනුම් තටාකයේ සමස්ථ අලාභය රු. 366,911 ක්වී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී රු.143,750 ක් වැයකර කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර 03ක් හා ආරක්ෂක කැමරා පද්ධතියක් මිලදී ගෙන තිබුණු නමුත් මාස 04ක් වැනි කෙටි කාලයක් තුළදී ඇඟිලි සලකුණු යන්ත්‍ර 03 ක්‍රියා විරහිත වී තිබුණි.

## 1.13 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) යුනෙස්කෝ ආයතනය විසින් ඉකුත් වර්ෂයේදී ලබාදී තිබුණු රු.3,347,579 ක්වූ ප්‍රදාන උපයෝජනය සඳහා සමාලෝචිත වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීමක් මගින් රු.2,847,579 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. අදාළ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වීම නිසා සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසානයේදී, යුනෙස්කෝ ආයතනය වෙතින් ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනයම ආපසු යැවීමට සිදුවී තිබුණි.

(ආ) පළාත් 09 තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහා ජාතික මට්ටමේ අන්තර්කරණ හා සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණ යටතේ බස්නාහිර පළාතේද එවැනි මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබුණි. මේ සඳහා 2007 වර්ෂයේ සිට අවස්ථා හතරකදී රු. මිලියන 56 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු නමුත් 2014 ජුනි 30 දින වන විටත් අදාළ කාර්යය සඳහා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. සළසා ගෙන තිබුණු ප්‍රතිපාදනවලින් රු. 8,694,366 ක් වෙනත් කාර්යයක් සඳහා උපයෝජනය කර තිබුණි.

(ඇ) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලාව සඳහා තෝරාගත් අභ්‍යාසලාභීන් අදාළ විද්‍යාපීඨවලට ඇතුළත් කිරීමේදී එළඹ තිබුණු ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව, පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණු හෝ එය සාර්ථකව සම්පූර්ණ කරන ලද නමුත් වර්ෂ 05 ක අවම සේවා කාලයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන රජයේ පාසලක ගුරුවරයෙකු ලෙස සේවය කර නොතිබුණු අභ්‍යාසලාභීන් 37 දෙනෙකු වෙතින් 2013 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.15,489,323ක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) ජාතික පාසැල්වල පවතින සමහර ශිෂ්‍ය නේවාසිකාගාර රජයට පවරාගෙන නොතිබුණු බැවින් නේවාසිකාගාර අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා ස්ථිර කාර්ය

මණ්ඩලයක් පත්කිරීමට නොහැකිවී තිබුණි. ඒ සඳහා ගුරු සේවයේ නිලධාරීන් සහ/ හෝ අනියම් පදනම මත බඳවා ගත් සේවකයින් පත්කිරීමට සිදුවී තිබීම හේතුවෙන් නේවාසිකාගාර මූල්‍ය පාලනයේ හා නඩත්තු කිරීම් කටයුතුවල දුර්වලතා පැවතුනි.

(ඉ) අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක ඉදිකරමින් පැවති ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල, 2011 වර්ෂයේ සිට ඉදිකිරීම් අත්හිටුවා තිබුණු අතර ස්ථාන කිහිපයක් පිපිරීම්වලට භාජනය වී තිබීම හා නිසි නඩත්තු ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් පළමු මහලේ නාන කාමර, වැසිකිළි පද්ධතිය හා අනෙකුත් ස්ථාන ප්‍රයෝජනයට ගත නොහැකි පරිදි විනාශ වෙමින් පැවතිණි. 6´×3´ ප්‍රමාණයේ මෙට්ට 15ක් සහ 6´×3´ ඇඳන් 25ක් 2012 අප්‍රේල් 06 දින සිට භාවිතයට නොගෙන අනාරක්ෂිතව ගොඩනැගිල්ල තුළ තිබුණි.

(ඊ) මාතර දිස්ත්‍රික්කයේ පාසලක වර්ෂ 100 කට වඩා පැරණි ප්‍රධාන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) සම්පූර්ණ ඇස්තමේන්තුව එකවර පිළියෙල නොකර අවස්ථා දෙකකදී රු.7,727,000 ක් හා රු. 3,912,482 ක්වූ ඇස්තමේන්තු දෙකක් පිළියෙල කර තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිළිවෙලින් රු. 5,965,362 ක් හා රු.3,490,287 ක්වූ කොන්ත්‍රාත් වටිනාකම් සඳහා කොන්ත්‍රාත් දෙකක් පිරිනමා තිබුණි.

(ii) ඇස්තමේන්තු පිළියෙල කිරීමට ප්‍රථම අළුත්වැඩියා කළ යුතු හා නොකළ යුතු කොටස් නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු නිසි ලෙස පිළියෙල නොකිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් දෙකෙහි වැඩ නියමිත දිනට අවසන් නොකිරීම වැනි හේතු නිසා, පළමු කොන්ත්‍රාත්තුව සඳහා රු.556,817 ක් හා රු.979,544 ක් වූ අමතර වැඩ හා බාහිර වැඩ සඳහා ගෙවීම් කිරීමට සිදුවී තිබුණි.

(iii) ලැටිස් පටි සපයා සවි කිරීමට රු.995,538 ක්ද, ජල පාදක දැව ආරක්ෂක යෙදීමට රු.68,349 ක්ද වැයකර තිබුණු නමුත් ඒවා පිරිවිතරවලට හා ප්‍රමිතියට අනුකූල නොවූ අතර බිමට කොන්ක්‍රීට් හා සිමෙන්ති දැමීමට රු.1,381,785 ක් ගෙවා තිබුණද බිම සම්පූර්ණ හරස් අතට පුපුරා ගොස් තිබුණු බව භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය. දොර සහ ජනෙල් සඳහා භාවිතා කර තිබුණු දැව හා යතුරු තහඩු නිසි ප්‍රමිතියකින් තොරවීය.

(iv) පළමු කොන්ත්‍රාත්තුවට ඇතුළත්වී තිබුණු විෂයය 21-ඒ11 ඉටුනොකර එය දෙවන කොන්ත්‍රාත්තුවට ඇතුළත්කර තිබීම හේතුවෙන් ඊට අදාළ මිල ගණන රු.780 සිට රු.1,350 දක්වා ඉහළ ගොස් තිබුණි.

(උ) මාතර දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක පවත්වාගෙන යන දකුණු පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන්වූ ක්‍රීඩා නේවාසිකාගාරය ඉතා අබලන් තත්ත්වයෙන් පවතින අතර සිසුන්ගේ පොත්පත්, ඇඳුම්, ඇඳන් හා මෙට්ට වැසි ජලයට හසුව දිරාපත්වී තිබුණි. වැසිකිළි 10 ම පාවිච්චි කිරීමට නොහැකි තත්ත්වයක පැවති අතර සිසුන්ගේ ආහාර වියදම් හා සේවක වැටුප් වියදම් සඳහා නියමිත පරිදි මුදල් ලැබී නොතිබුණි. මෙම කරුණු හේතුවෙන් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය වන විට නේවාසික ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව 683 සිට 262 දක්වා අඩුවී තිබුණි. නේවාසිකාගාර අළුත්වැඩියාව සඳහා රු.3,410,000 ක මුදලක් අනුමතවී තිබුණද ඒ සම්බන්ධ කිසිදු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.14 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා
------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | | 3,500 | 1,971 | 1,529 | - |
| (ආ) | තෘතියික මට්ටම | - මාණ්ඩලික | 16 | 12 | 6 | 2 |
| | | - විදුහල්පති | 16,512 | 9,070 | 7,442 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | - ගුරුභවතුන් | 215,028 | 216,231 | - | 1,203 |
| | | -මාණ්ඩලික නොවන | 4,266 | 3,133 | 1,220 | 87 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | - කණිෂ්ඨ ශ්‍රේණිය | 8,092 | 4,094 | 4,002 | 4 |
| (ඉ) | වෙනත් | | 3 | 1,100 | - | 1,097 |
| | එකතුව | | 247,417 | 235,611 | 14,199 | 2,393 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය වෙනුවෙන් පිළියෙල කර තිබුණු නව සංවිධාන ව්‍යුහයට අනුව තම රාජකාරි සැලැසුම් කිරිමටත්, අවශ්‍ය කාර්ය මණ්ඩලය ගලපා ගැනීමටත්, එක් එක් ශාඛාවලට අදාළ කාර්යයන් හා වගකීම් නිශ්චිතව හඳුනාගැනීමටත් කටයුතු කර නොතිබුණි. අමාත්‍යාංශය තුළ දැනට ස්ථාපිත කර ඇති එකිනෙක අංශයන්ට අනුයුක්තව සිටින මාණ්ඩලික හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය, එම එකිනෙක අංශයේ වගකීම හා ඉටුකරන කාර්යයන් සමඟ ගැලපීමක් කර නොතිබුණු නිසා කාර්ය මණ්ඩලයේ තථ්‍ය ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමට නොහැකිවී තිබුණි. තවද, නිලධාරීන් ස්ථාන මාරුවීම්, විශ්‍රාමයාම් සහ නව පත්වීම් ලබාදීම් පිළිබඳ තොරතුරු මානව සම්පත් සංවර්ධන ශාඛාව වෙත ලැබෙන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණු බැවින් කාර්ය මණ්ඩලය පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් සකස් කිරීමට මානව සම්පත් සංවර්ධන ශාඛාවට නොහැකිවී තිබුණි.

(ii) පාසලක කළමනාකරණ හා පරිපාලන කටයුතු මත එම පාසැලෙන් දරුවන්ට ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මක බව හා ඵලදායී බව තීරණය වන බැවින්ද, පාසැලේ කීර්තිනාමය ආරක්ෂා කිරීමට හා කාර්ය මණ්ඩල සාමාජිකයින් නායකත්වය වටා ඒකරාශී කිරීමටද විදුහල්පති තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය කාරණයක් වුවද, පුරප්පාඩු පිරවීමට සැලසුම් සහගත නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකර එකිනෙක පාසැලේ නමින් අයදුම්පත් කැඳවා පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම හේතුවෙන් දිවයින පුරා පිහිටි ජාතික පාසැල් 350 න් 100 ක, 2014 පෙබරවාරි 05 දින වන විට වර්ෂ 01 - 14 දක්වා කාලපරාසයක් සහිතව විදුහල්පති තනතුරු පුරප්පාඩුව පවතින අතර, එම කාලපරාසය තුළදී එම තනතුරුවල වැඩබැලීමට හෝ රාජකාරි ආවරණය කිරීමට විදුහල්පතිවරු පත්කර තිබුණි.

2. ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව

2.1 විගණන විෂය පථය

විභාග දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජුලි 24 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා

ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2.3 විගණන නිරීක්ෂණ

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විභාග දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ, මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.9 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(ආ) අයවැය විචලනය

---

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.97,049,060ක් වූ අතර, එය එම වැය

විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 46 සිට සියයට 99 දක්වා ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 21201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.702,755 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් විය.

2.4 වත්කම් කළමනාකරණය

---

(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

---

බෝල්වලාන පුහුණු මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි $1726.93m^2$ ක ප්‍රමාණයක් වසර 03 කට අධික කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 ජුලි 27 දින විගණකාධිපතිට ඉදිරිපත් කර තිබුණි.

2.5 අනුකූල නොවීම්

---

(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 34,869,087 | වැය විෂයයන් 05 කට සළසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.1,350,954 ක් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී බැරකම්වලට එළඹ තිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 396 (ඈ) | 6,989,045 | නිකුත් කළ නමුත් කල් ඉකුත් වූ එකතුව රු.6,989,045 ක්වූ චෙක්පත් 4057ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756(4) | - | නිෂ්කාර්ය වත්කම් හඳුනා ගැනීම සහ ඒවා පිළිබඳ වාර්තා කිරීම සඳහා විශේෂ මණ්ඩලයක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි / ගණන් දීමේ නිලධාරි විසින් පත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1647(ආ) | - | දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## **2.6** කාර්යසාධනය

### සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂයේ විභාග සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ආයතන හා විදේශ විභාග 230 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද විභාග 141 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.7 අනාර්ථික ගනුදෙනු

වාර්ෂිකව ලිපිකවර අවශ්‍යතාවය හඳුනා නොගෙන ලිපිකවර මිලදී ගැනීම නිසා 2013 සැප්තැම්බර් වන විට රු.12,578,410 ක් වටිනා හිටපු විභාග කොමසාරිස් ජනරාල්ගේ නම මුද්‍රිත වර්ග 12 කට අයත් ලිපිකවර 1,672,786 ක් භාවිතයට නොගෙන ගබඩාවේ ඉතිරි වී තිබුණි.

2.8 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) දුර බැහැර ගමන් කිරීම සඳහා සංචිත වාහන යෙදවීමේදී ඉන්ධන අත්තිකාරම් එම වාහනය භාරව ගමන් කරන නිලධාරියෙකුට ලබා නොදී එම වාහනවල රියදුරන් වෙත ලබාදී තිබුණු අතර සංචිත වාහනවලට ඉන්ධන පිරවීම වාහන භාර නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබුණි.

(ආ) 2012 වසර සඳහා පුද්ගලික ආයතනයක් වෙතින් ඉන්දුනීසියන් වුඩ් ෆී කඩදාසි රිම් 12500 ක් රු.41,797,559 කට මිලදී ගැනීම සිදුකර තිබූ අතර ලංසුකරුවන් සඳහා උපදෙස් පත්‍රිකාවේ 31 ජේදයට අනුව සපයනු ලබන භාණ්ඩ නියමිත පිරිවිතරවලට අනුකූල විය යුතු බව සඳහන් කර තිබුණි. අවස්ථා කිහිපයකදී අහඹු ලෙස තෝරා ගත් කඩදාසි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා කාර්මික තාක්ෂණ ආයතනය මගින් පරික්ෂා කර පිරිවිතරවලට අනුකූල නොවූ අවස්ථා වාර්තා කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ හෝ නිර්දේශ ලබා ගැනීමකින් තොරව ගිවිසුම්ගත මුළු මුදලම ගෙවා තිබුණි.

2.9 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 84 | 64 | 20 | - |
| (ii) | තෘතියික මට්ටම | 16 | 10 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 394 | 337 | 57 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 166 | 122 | 44 | - |
| (v) | වෙනත්(අනියම් /තාවකාලික / කොන්ත්‍රාත් පදනම මත) | - | 69 | - | 69 |
| | එකතුව | 660 | 602 | 127 | 69 |

**3.** ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

3.1 විගණන විෂය පථය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජුලි 21 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණ**

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, අනුමත අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශයෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙළ කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විෂය අංක 21302 දරන පොත් මුද්‍රණය, ප්‍රචාරනය හා අලෙවිය පිළිබඳ අත්තිකාරම් ගිණුම 2014 අප්‍රේල් 30 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණද, එය දින 23 ක ප්‍රමාදයක් සහිතව 2014 මැයි 23 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

----------------------------------------------------

මුදල් රෙගුලාසි 94(1) හි දැක්වෙන විධිවිධානවලට පටහැනිව, විෂයයන් 05 කට සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.7,420 ක් ඉක්මවා රු. 320,072 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 21301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.479,365 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) විෂය අංක 21302 දරන පොත් මුද්‍රණය, ප්‍රචාරනය හා අලෙවිය පිළිබඳ අනුමත අත්තිකාරම් ගිණුම

------------------------------------------------------------------------------------------

(i) විෂය නිර්දේශ වෙනස්වීම හා වෙනත් හේතූන් මත භාවිතයට ගත නොහැකි ලෙස සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව හඳුනාගෙන තිබූ රු.312,831,071 ක පොත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අපහරණය කර තිබූ නමුත්, එම ශේෂය පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ii) 2009 දෙසැම්බර් 31 දින සිට පැවත එන රු.303,469,564 ක්වූ භාවිතයෙන් ඉවත් කළ පොත් තොග ගිණුමෙහි වටිනාකම පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(iii) 2012 අත්තිකාරම් ගිණුම් විගණනයේදීද පෙන්වා දී තිබූ ශේෂපත්‍රයේ වැය සම්මත යෙදවුම්වල වටිනාකම හා ස්ථාවර වත්කම්හි පිරිවැය අතර

රු.223,582 ක වෙනස ඇතිවීමට හේතු සොයා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iv) 2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව සංශෝධිත උපරිම බැරකම් සීමාව රු.1,950,000,000 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමස්ථ බැරකම් රු.1,884,542,544 ක් අනුමත වියදම් සීමා හා සත්‍ය වියදම් පිළිබඳ ප්‍රකාශයේ අනාවරණය කිරීමකින් තොරව සත්‍ය බැරකම් කිසිවක් "නැත" ලෙස දක්වා තිබුණි.

(v) 2012 වර්ෂයේ මිලදීගෙන තිබූ එකතුව රු.949,940 ක ස්ථාවර වත්කම් සඳහා රු.284,982 ක ක්ෂයවීම් හඳුනාගෙන නොතිබීමෙන් වාර්ෂික ලාභය සහ ස්ථාවර වත්කම්වල අගය එම ප්‍රමාණයන්ගෙන් අධිප්‍රමාණය වී තිබුණි.

(vi) මුද්‍රණ ණයහිමියන්ට මුදල් ගෙවීම් ලේඛණය ප්‍රකාරව පොත්වල පිටු වැඩිවීම මත රු.21,154 ක් ගෙවා තිබූ අතර පිටු අඩුවීම මත රු.4,037 ක් අඩුකර ගෙවා තිබුණි. ඒ අනුව ණයහිමි ගිණුමට මෙම සංඛ්‍යා දෙක අතර වෙනස වූ රු.17,117 ක් ගැලපිය යුතු වුවද, ලෙජරයේ ණයහිමි ගිණුමට පිටු වෙනස් වීම මත ගලපා තිබූ මුදල රු.50,167,130 ක් විය. මෙම වටිනාකම ගැලපීම සම්බන්ධයෙන් තහවුරු සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීණි.

(vii) මුද්‍රණ අත්තිකාරම් ලේඛණය පරිදි 2013 දෙසැම්බර් 31 දිනට නොපියවී ඇති අත්තිකාරම් මුදල රු.340,960,140 ක් වුවත් ලෙජරයේ එම අත්තිකාරම් ශේෂය රු.326,339,399 ක් විය. ඒ අනුව නොපියවී ඇති අත්තිකාරම් රු.14,620,741 ක වෙනසක් විය.

(viii) අනුමත අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.8,323,968 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ix) අතැති තොග අගය කළ යුත්තේ පිරිවැය හෝ වෙළඳ පොළ මිල යන දෙකෙන් කවර හෝ අඩු මිලට වුවද භාවිතයට ගත නොහැකි පිරිවැයට අගය කල රු.11,099,227ක් ආරම්භක නිමි තොගයට හා රු.17,262,456 ක් අවසන් නිමි තොගයට වෙන් කිරීමකින් තොරව ඇතුළත් කර තිබුණි.

3.4 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

------------------------------------------

ගැලපුම් කළ යුතු ශේෂ

--------------------------

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව නිකුත් කළ නමුත් වර්ෂයකට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.15,194 ක් වටිනා චෙක්පතක් විය.

3.5 අරමුණුවලට පටහැනි ගෙවීම්

--------------------------------

මහින්දෝදය පාසල් 1000 හේ වැඩසටහන පිළිබඳව පුවත්පත් දැන්වීමක් පළ කිරීම සඳහා රු.308,000 ක් වැයකර තිබුණු අතර එය නොමිලේ පෙළපොත් සැපයීම සඳහා වූ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

3.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2011 වර්ෂයේ අතිරේක පොත් මුද්‍රණය යටතේ "ආර්ථික වර්ධන හා සංවර්ධන" කෘතිය පිටපත් 2000 ක් හදිසි මිලදී ගැනීම් යටතේ මිල ගණන් කැඳවීමකින් තොරව වැඩි මිලකට රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් මුද්‍රණය කර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දින වනවිටද විකුණුම් වටිනාකම රු.1,836,980 ක් වූ පොත් 1733 ක් අලෙවියෙන් තොරව ඕල්කට් ගබඩාවේ පැවතුනි.

(ආ) 2007 වර්ෂයේ මුද්‍රණය කර තිබූ සිංහල මාධ්‍ය ගණිත වගු පොත් 50000 න් 2014 මාර්තු 31 දිනට පිටපත් 8866 ක් පමණක් අලෙවි කර තිබීමෙන් විකුණුම් වටිනාකම රු.2,056,700 ක් වටිනා පොත් 41,134 ක් අලෙවියකින් තොරව ගබඩා ගතව පැවතුනි.

(ඇ) 2012 භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගණිත වගු පොත් 44,929 ක ශේෂයක් පැවතියදී නැවතත් රු.54,500 කට පොත් 10000 ක් මුද්‍රණය සඳහා 2013 පෙබරවාරි 21 දින ඇණවුම් ලබාදී තිබූ අතර විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 13 දින වන විටත් එයින් කිසිදු පිටපතක් අලෙවි කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂය සඳහා පෙළපොත් මුද්‍රණයේදී පළමු ඇණවුම මගින් ලබාදුන් පොත් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වර්ග 150 කින් පිටපත් 936,800 ක් මුද්‍රණය

කිරීම සඳහා ඇණවුම් ලබා දී තිබුණි. එම ඇණවුම් පත්‍රයේ හා කොන්දේසි පත්‍රයට අනුව භාරදීමට ප්‍රමාද වූ පොත් වෙනුවෙන් සම්පූර්ණ දඩ මුදල් අයකළ යුතු වුවද, 2012 මැයි 30 දිනැති අංක ඊපීඩී/එෆ්ඩී/01 දරන ලිපිය මගින් අයකර ගෙන තිබූ ප්‍රමාද දඩ මුදල් මුද්‍රණ ආයතනවල ඉල්ලීමකින් හෝ තොරව නැවත ගෙවීමට මෙහෙයුම් කමිටු සාමාජිකයින් විසින් අනුමත කර තිබුණු අතර පොත් වර්ග 30 ක් වෙනුවෙන් අයකර ගන්නා ලද රු.866,033 ක ප්‍රමාද දඩ මුදල් ආපසු ගෙවා තිබුණි.

3.7 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තත්‍ය සේවක සංඛ්‍යා

-------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 36 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 104 | 57 | 47 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 71 | 51 | 20 |
| (v) | වෙනත් (අනියම් /තාවකාලික / කොන්ත්‍රාත් පදනම මත) | 315 | 130 | 185 |
| | එකතුව | 539 | 275 | 264 |